| | |
|---|---|
| 8 ශ්‍රේණිය | මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය<br>දෙවන වාර ඇගයීම - 2025<br>විද්‍යාව |

නම/ විභාග අංකයඃ ........................................ කාලය : පැය 2 යි

**1 කොටස**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න.**
- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.**

01. ආගන්තුක මුලක ආහාර ගබඩා කර ඇති ශාකයකි.
    i. බතල
    ii. හබරල
    iii. රාබු
    iv. අර්තාපල්

02. පාන් පෙත්තක් මත සියුම් කෙඳි පටලයකින් හා කළු පැහැති ව්‍යුහ වලින් සමන්විත ක්ෂුද්‍රජීවී විශේෂය වන්නේ,
    i. යීස්ට් නම් දිලීරයයි.
    ii. මියුකර් නම් දිලීරයයි.
    iii. ක්ලැමිඩමොනාස් නම් ඇල්ගීයයි.
    iv. ඇමීබා නම් බැක්ටීරියාවයි.

03. එකම කාණ්ඩයට අයත් ජීවීන් යුගලක් නොවන්නේ,
    i. ගැඩවිලා, කුඩැල්ලා
    ii. පත්තෑයා, සලමන්දරා
    iii. ගොළුබෙල්ලා, දැල්ලා
    iv. ඉස්සා, ගෝනුස්සා

04. වඩා ප්‍රබල චුම්භකයක් නිර්මාණය කිරීම සඳහා භාවිතා වන මිශ්‍ර ලෝහය වන්නේ,
    i. යකඩ
    ii. නිකල්
    iii. නික්‍රෝම්
    iv. ෆෙරයිට්

05. ගැල්වනයිස් කිරීමේදී භාවිතා කරනු ලබන්නේ මින් කුමක් ද?
    i. යකඩ
    ii. සින්ක්
    iii. ටින්
    iv. තීන්ත

06. රූපයේ දැක්වෙනුයේ බන්සන් දැල්ලක රූප සටහනකි. ඒ ඇසුරින් 6 හා 7 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




D ලෙස දක්වන කලාපය වන්නේ,
    i. අදෘශ්‍ය කලාපයයි.
    ii. ලා නිල් කලාපයයි.
    iii. තද නිල් කලාපයයි.
    iv. අදීප්ත කලාපයයි.

07. මින් පූර්ණ දහනයක් සිදුවන්නේ කුමන කලාපයේ ද?
    i. A
    ii. B
    iii. C
    iv. D

08. උදාසීන ද්‍රව්‍යය හමුවේ,

i. නිල් ලිට්මස් රතු පැහැ වේ.

ii. රතු ලිට්මස් නිල් පැහැ වේ.

iii. ඉහත (a) හා (b) යන අවස්ථා දෙකම සිදු නොවේ.

iv. ෆිනොප්තැලින් වල වර්ණය වෙනස් නොවේ.

09.



ඉහත ක්‍රියාකාරකමින් පැහැදිලි වන්නේ මල බැඳීම සඳහා

i. වාතය අවශය වෙයි

ii. ජලය අවශය වෙයි

iii. ඔක්සිජන් අවශ්‍ය වෙයි

iv. වාතය හා ජලය අවශය බවයි

10. මිනිසාගේ ශ්‍රව්‍යතා සීමාව වන්නේ,

i. 20 - 2000 Hz

ii. 20 - 20000 Hz

iii. 18 - 70000 Hz

iv. 25 - 25000 Hz

11. ක්ෂුද්‍රජීවී වර්ධනයට සුදුසු තත්වයක් නොවන්නේ,

i. ජලය

ii. යෝග්‍ය උෂ්ණත්වය

iii. සුදුසු PH පරාසය

iv. වියළි උපස්ථරයක්

12.




ස්ථිර චුම්භකයක චුම්භක ක්ෂේත්‍රය විනාශ නොවී ගබඩා වන ආකාරය මෙහි වේ. මෙහි x,y,හා z පිළිවෙළින්,

i. N අග්‍රය, S අග්‍රය මෘදු යකඩ තහඩු

ii. S අග්‍රය, N අග්‍රය මෘදු යකඩ තහඩු

iii. N අග්‍රය, S අග්‍රය ලී අණ්ඩ

iv. S අග්‍රය, N අග්‍රය මෘදු යකඩ තහඩු

13. බල්බ ශ්‍රේනිගතවද වියලි කෝෂ සමාන්තරගතවද පිහිටා ඇති විද්‍යුත් පරිපථය වන්නේ,



A. B. C. D.

14. දේහයේ සමතුලිතතාවය පාලනය කරනු ලබන කොටස වන්නේ,

i. මස්තිෂ්කයයි.

ii. අනුමස්තිෂ්කයයි

iii. සුසුම්නා ශීර්ෂකයයි

iv. සුෂුම්නාවයි

15. කපාල ස්නායු යුගල් ගණන වන්නේ,

i. 12 ය
ii. 31 ය
iii. 24 ය
iv. 43 ය

16. රසායනික විපර්යාසයක් සිදු නොවන අවස්ථාවක් වන්නේ පහත කුමන අවස්ථාවේදී ද?

i. ගිනිකූරක් දහනය වීම
ii. යකඩ මල බැඳීම
iii. මැග්නීසියම් පටියක් දහනය වීම
iv. ජලය රත්කර වාෂ්ප කිරීම

17. ද්‍රව ඉන්ධනයක් සඳහා නිදසුනක් නොවන්නේ,

i. භූමිතෙල්
ii. පෙට්‍රල්
iii. ඩීසල්
iv. ද්‍රැවීකෘත පෙට්‍රෝලියම්

18. කාබන්ඩයොක්සයිඩ් හා ජලය බහිස්‍රාවී ලෙස පිටකරන බහිස්‍රාවී ඉන්ද්‍රිය වන්නේ පහත ඒවායින් කුමන අවයව ද?

i. නාසය
ii. පෙනහළු
iii. මුඛය
iv. වකුගඩු

19. ස්කන්ධ සංස්ථිති නියමය ප්‍රථම වරට අනාවරණය කළ විද්‍යාඥයා වන්නේ,

i. ඇන්ටනී ලැවොයිසියර්
ii. ඇරිස්ටෝටල්
iii. ඇන්ටන් වැන් ලීවන්හුක්
iv. ඩිමොක්‍රිටීස්

20. කාමර උෂ්ණත්වයේදී ද්‍රව අවස්ථාවේ පවතින ලෝහමය මූලද්‍රව්‍ය වන්නේ,

i. ලෙඩ්
ii. ම'කරි
iii. බ්‍රෝමීන්
iv. මධ්‍යසාර

## II කොටස

**පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**

01.

A. රූපයේ දැක්වෙනුයේ පදාර්ථයක භෞතික ලක්ෂණයක් පරීක්ෂා කිරීමට සිදු කළ ක්‍රියාකාරකමකි.

1. A හා B නම් කරන්න. (ල. 2)




2. ඉහත ක්‍රියාකාරකම ඇසුරින් හඳුනාගන්නා භෞතික ලක්ෂණය කුමක් ද? (ල. 1)
3. ඔබ (2) හි සඳහන් කළ ලක්ෂණය හැර පදාර්ථය සතු භෞතික ලක්ෂණ 03 ක් නම් කරන්න. (ල. 3)
4. ''කුඩා මිටියකින් තට්ටු කල විට හුණු කූරක් කුඩු වන අතර, තඹ තහඩුවක් බවට පත් වේ.'' ඉහත ප්‍රකාශයෙහි සඳහන් හුණු කූරෙහි හා තඹ කැබැල්ලෙහි සතු භෞතික ලක්ෂණ 02 වෙන් වෙන්ව සඳහන් කරන්න. (ල. 2)

B. බන්දන දහනයේදී නිපදවන එල හඳුනා ගැනීමට සිදු කල ක්‍රියාකාරකමක් රූපයේ දැක්වේ.




1. x හා y නම් කරන්න. (ල. 2)
2. මෙම ක්‍රියාකාරකමේදී පිටවන ද්‍රව්‍ය හා ඒවා හඳුනා ගැනීඹට ඇති ද්‍රව්‍ය ඇතුලත් පහත වගුව සම්පූර්ණ කරන්න. (පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන සම්පූර්ණ කරන්න.)

| පිටවන ද්‍රව්‍ය | හඳුනාගැනීමට එක් කර ඇති ද්‍රව්‍ය | එමගින් සිදුවන වර්ණ විපර්යාසය |
|---|---|---|
| (1) ………………… | ………………………….. | ………….. → ………….. |
| (2) ………………… | ………………………….. | ………….. → ………….. |

(ල. 6)

02. ඔබට සපයා ඇති විදුලි උපාංග කිහිපයක් රූපයේ දැක් වේ.



A.. B. C. D.

1. ඉහත උපාංග එක් කර සරල පරිපථයක් ගොඩ නගන්න. එහි රූප සටහනක් පිළිතුරු පත්‍රයේ ඇද දක්වන්න. (ල. 1)
2. එහි බල්බයේ දෙකෙළවර විභව අන්තරය මැනීමට සුදුසු උපකරණයක් එම පරිපථයටම එක් කරන්න. (ල. 1)
3. ඉහත උපකරණය පරිපථයට එක් කරනුයේ සමාන්තරගතව , ශ්‍රේණිගතව ද? (ල. 1)
4. එම උපකරණයෙන් මිනුම ලබා ගන්නා ඒකකය හා ඒකකයේ සංකේතය ලියා දක්වන්න. (ල. 2)
5. A උපකරණයට පතිත වන යම් සාධකයක් මත බල්බයේ දීප්තිය අඩු වැඩි විය. A උපකරණය හඳුන්වන්න. ල. 1)




A. B. C.

B. විද්‍යා ප්‍රදර්ශනය සඳහා සිසුන් ඉදිරිපත් කල සංගීත භාණ්ඩ ආකෘති කිහිපයක් ඉහත දැක් වේ.

1. ඒවායේ හඬ නිපදවන්නේ කුමන කොටස් කම්පනය වීමෙන්දැයි වෙන වෙනම දක්වන්න. (ල. 3)

2. A හි කම්පන ද්‍රව්‍ය හොඳින් ඇදී ඇති විට ශබ්ද වෙනස් වන බව ඔබ අත් දැක ඇත. එයට හේතුව සඳහන් කරන්න. (ල. 1)

3. C සංගීත භාණ්ඩයෙන් තියුණු හඬක් නිපදවීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රමවේදයන් සඳහන් කරන්න. (ල. 1)

03. රූපයේ දැක්වෙනුයේ සමාන යකඩ කෙඳී ගුලි 2කින් එකක් රත් කරන අවස්ථාවකි.



එහිදී ලැබෙන,

1. එය රත් කරන විට ලැබෙන නිරීක්ෂණ 02 ක් ලියන්න. (ල. 3)
2. එහිදී ඔබ ලබා ගන්නා නිගමනය කුමක් ද? (ල. 1)
3. මෙහිදී සිදුවන්නේ රසායනික ප්‍රතික්‍රියාවක් ද? භෞතික ප්‍රතික්‍රියාවක් ද? (ල. 1)
4. එය සනාථ කිරීම සඳහා සාක්ෂි 02 ක් ඉදිරිපත් කරන්න. (ල. 2)
5. ඔබ ඉහත (1) හි සඳහන් කල එක් නිරීක්ෂණයක් වෙනස් කිරීමට ඔබ ඇටවුම කුමන පද්ධතියක් ලෙස වෙනස් කල යුතු ද? (ල. 1)
6. එවිට ඔබට අණාවරණය කල හැකි නියමය කුමක් ද? (ල. 1)
7. ඉහත දහනය සිදුවීම සඳහා අවශ්‍ය ප්‍රධාන සාධක 3 කුමක් ද? (ල. 3)

04.

A. හිස්තැන් වලට සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

1. සීනි හා යීස්ට් මිශ්‍රණයෙන් මධ්‍යසාර ගන්ධය සංවේදනය වන්නේ එහි නිපදවෙන ………………………… නිසාය.
2. උණ සන්නිපාතය ………………………… මගින් මිනිසාට වැළඳෙන බෝවන රෝගයකි.
3. ප්‍රෝටීන බහුල ආහාරමි ක්ෂුද්‍රජීවී ක්‍රියාකරීත්වය ………………………… ලෙස හඳුන්වයි.
4. දේහය කාණ්ඩ වලට බෙදී ඇති පණු ආකාර දේහ දරණුයේ ………………………… ය
5. ………………………… හට ග්‍රන්ථිවලින් තොර වියළි සමක් ඇත.

(රෙප්ටීලීයා, බැක්ටීරියා, එතිල් මධ්‍යසාර, ඇනලිඩා, පූතිභවනය, පැසීම)

(ල. 6)

B. පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (√) සලකුණ ද වැරදි නම් (X) සලකුණ ද වරහන් තුළ යොදන්න.

1. සලමන්දරා පෘෂ්ඨවංශියෙකි ( )
2. බාහිර කන්පෙති සහිත කන් ඇත්තේ ආවේස්ට ය. ( )
3. ආත්‍රපෝඩා දේහය මතුපිට බාහිර සැකිල්ලක් ඇත. ( )
4. ක්ලැමිඩමොනාස් බැක්ටීරියා විශේෂයෙකි. ( )
5. 35 $^0$c -40 $^0$c උෂ්ණත්වයේ දී ආහාර ඉතා ඉක්මනින් නරක් වේ. ( )
6. පිස්කේස් පිහිනීම සඳහාත්, දේහ සංතුලනය සඳහාත් කරමල් යොදා ගෙන ඇත. ( )

(ල. 5)

05. ක්ෂේත්‍ර චාරිකාවකට සහභාගී වූ සිසුන් නිරීක්ෂණය කල ජීවීන් ශාක පිළිබඳ වාර්ථාවක් පහත වේ.

| ශාකය | අටකර කාර්ය සඳහා වූ අනුවර්තනය | ඉන් ඉටුවන කාර්යය |
|---|---|---|
| මහකඩොල් | වායුධර මුල් | ...................................... |
| වැටකෙයියා | .............................. | කඳෙන් හටගෙන පොළොව දක්වා වැඩී කඳට ආධාරකය ලෙස |
| ගොටුකොළ | .............................. | ...................................... |
| .............................. | ආහාර සංචිත භූගත කඳන් | ...................................... |
| බෝංචි | .............................. | සූර්යාලෝකය වඩා හොඳින් ලබා ගැනීමට |

(ල. 7)

1. ඉහත වගුවේ සඳහන් සියලුම ශාක කොළ පැහැතිය. ඒ ඇසුරින් එම ශාක වල සිදුවන ප්‍රධාන ජීව ක්‍රියාවලිය කුමක් ද? (ල. 1)
2. ඒ සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය 2 ක් නම් කරන්න .(ල. 2)
3. ඒ සඳහා අවශ්‍ය ආලෝක ශක්තිය කාර්යක්ෂම ලෙස ලබා ගැනීමට ශාක පත්‍රයක් සැකසී ඇත්තේ කෙසේ ද? (ල. 1)

06.




1. A,B,C,D, නම් කරන්න. (ල. 2)
2. ඉහත පද්ධතිය මගින් නිර්මාණය වන ප්‍රධාන බහිස්‍රාවී ඵලය කුමක් ද? (ල. 1)
3. එහි ඵලය හැරුණු විට අඩංගු වෙනත් සංඝටකයක් නම් කරන්න. (ල. 2)
4. මෙම පද්ධතිය ආශ්‍රිතව නිර්මාණය වන ආබාධ 02 ක් නම් කරන්න. (ල. 1)
5. බහිස්‍රාවී ඉන්ද්‍රියක් ලෙස ක්‍රියාකරන මිනිස් සිරුරේ විශාලතම ඉන්ද්‍රිය කුමක් ද? (ල. 1)

**(ල. 7)**

B. දණ්ඩ චුම්භකයක් හා ඔරලෝසු තැටි 02ක් ආධාරයෙන් කළ ඇටවුමක් පහත දැක් වේ.




1. ඉහත ක්‍රියාකරකම ඇසුරින් හඳුනාගත හැකි නිරීක්ෂණ කුමක් ද? (ල. 1 )
2. එම දණ්ඩ චුම්භකය චුම්භක ක්ෂේත්‍රය පිහිටන ආකාරය දළ රූපසටහනකින් ඇඳ දක්වන්න. (ල. 1)
3. ස්ථිර චුම්භකයක චුම්භකත්වය ක්ෂය වීමට තුඩු දෙන ප්‍රධාන හේතු 02 ක් ලියන්න. (ල. 2)